**විසර්ජන ශීර්ෂය : 258 - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**විගණකාධිපති වාර්තාව 2011 වර්ෂය**

---

## 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(අ) දිස්ත්‍රික් පරිපාලනය
(ආ) ව්‍යවස්ථාපිත කටයුතු
(ඇ) අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරිම
(ඈ) ආගමික හා සදාචාර සංවර්ධනය
(ඉ) සේවක සුභසාධනය
(ඊ) සම්බන්ධීකරණ හා මිත්‍රශීලි පරිපාලනය
(උ) සංවර්ධන වැඩසටහන් හා ගම නැගුම
(ඌ) රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජා සහභාගීත්වය
(එ) මාධ්‍ය සම්බන්ධීකරණය
(ඒ) පරිපාලනයේ ආකල්ප වර්ධනය හා පුහුණුව
(ඔ) තොරතුරු තාක්ෂණ භාවිතය

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල

(අ) ගඟවට කෝරළෙ
(ආ) පාතහේවාහැට
(ඇ) දෙල්තොට
(ඈ) උඩපළාත
(ඉ) උඩදුම්බර
(ඊ) පාතදුම්බර
(උ) පන්විල
(ඌ) හතරලියද්ද
(එ) පූජාපිටිය
(ඒ) තුම්පනේ
(ඔ) මිනිපේ
(ඕ) කුණ්ඩසාලේ
(ක) දොළුව
(ග) ගඟඉහළ කෝරළේ
(ච) යටිනුවර
(ජ) උඩුනුවර
(ට) හාරිස්පත්තුව
(ඩ) අකුරණ
(ණ) මැදදුම්බර
(ත) පස්බාගේ කෝරළේ

**1.3 විගණන විෂය පථය**

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 ඔක්තෝබර් 15 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදන හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 685,006,100 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් රු. 674,938,437 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම රු. 10,067,663 ක් වී තිබුණු අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.5 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **2011 දෙසැම්බර් 31 දිනට ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 606,050,000 | 615,806,100 | 32,324 | 0.0 |
| මලධන | 69,200,000 | 69,200,000 | 10,035,339 | 1.5 |
| එකතුව | 675,250,000 | 685,006,100 | 10,067,663 | 1.5 |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 22ක් විසින් එකතුව රු.140,407,986ක් ද, දෙපාර්තමේන්තු 17ක් විසින් රු.1,702,987,004ක් වශයෙන් එකතුව රු.4,276,050,990ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබී තිබුණි. එයින් කාර්යාලය විසින් පිළිවෙලින් එකතුව රු.1,834,164,097ක් හා එකතුව රු.1,591,839,198ක් වශයෙන් එකතුව රු.3,426,003,295ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එකතුව රු.850,047,695ක් හෙවත් ලැබී තිබුණු ප්‍රතිපාදනයෙන් 20% ක ප්‍රතිශතයක් ඉතිරිවී තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

විෂය අංක 25801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| <u>වියදම</u> | | <u>ලැබීම්</u> | | <u>හර ශේෂය</u> | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 54,950,000 | 53,971,675 | 37,000,000 | 61,046,038 | 250,000,000 | 191,038,288 |

## 2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම

2011 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංක : 6003/0000/00/0034/0000/000 දරන පොදු තැන්පත් ගිණුමේ ශේෂවල එකතුව රු. 195,747,962 ක් වී තිබුණි.

## 2.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ

2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.14 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති සමහර ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් පහත දැක්වෙන ලේඛන හා පොත්පත් පවත්වාගෙන නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1974 දෙසැම්බර් 19 දිනැත අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පාතදුම්බර, තුම්පනේ, උඩුනුවර, යටිනුවර හා මැදදුම්බර |
| පරිගණක සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | - එම- |

### (ආ) සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පිඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය පරිදි 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03ක් සඳහා සංයුක්ත සැලැස්මක් වර්ෂය ආරම්භයේ දී පිළියෙල කළයුතු වුවත්, එම සැලැස්ම 2011 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**(ඇ) වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම**

----------------------------

ඉහත (ආ) සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය පරිදි පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාර සැලැස්ම 2011 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**(ඈ) වාර්ෂික කාර්ය සාධන වාර්තා**

-------------------------------

ඉහත (ආ) හි රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කර විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව 2012 ජුලි 05 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**(ඉ) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

-------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය පරිදි වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2011 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**(ඊ) පොදු තැන්පත් ගිණුම**

----------------------

වර්ෂ 2ක් ඉක්මවූ රු.8,372,461 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(උ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

--------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

(i) විෂය අංක 25801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2011 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 4,087,550 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ණය ගෙවීමේ දී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර රු. 958,287 ක ණය ගෙවා තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත විග්‍රහ කර ඇති පරිදි ඇතැම් වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 1993 වර්ෂයේ දි සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු ට්‍රැක්ටරයක් සහ කෘෂි උපකරණ තොගයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.

(ii) උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රෙජිස්ටාර් කාර්යාලය පවත්වාගෙන යනු ලබන වර්ග අඩි 1505ක ප්‍රමාණයකින් යුක්ත වු ගොඩනැගිල්ල කිසිදු ප්‍රයෝජනයක් නොගෙන වසා දමා තිබුණි. දීර්ග කාලයක් තුළ වසා තැබීම නිසා මෙම ගොඩනැගිල්ල අබලන්ව ගරා වැටෙන තත්ත්වයට පත් වෙමින් තිබුණි.

(iii) ගඟඉහළ කෝරලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෝටර් රථයක් 2010 මැයි 12 දින සිට 2011 නොවැම්බර් 29 පරීක්ෂණ අවස්ථාව වන විටත් ධාවනයේ යෙදවීමකින් තොරව කාර්යාල භූමියේ නිශ්ක්‍රීයව පැවතුණි.

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

උඩුනුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2010 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ඌනතා ලෙස පෙන්වා ඇති අයිතමයන් 31 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) අනුව කටයුතු කර නොතිබුණි.

### (ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් මහනුවර යටිනුවර වීදියේ පිහිටි අංක 71 දරන අතිරේක දිස්ත්‍රික් ලේකම් සඳහා වු රජයේ නිවස 2003 පෙබරවාරි 01 දින සිට ශ්‍රී ලංකා යුධ හමුදා පොලිස් සේවා බලකායේ පරිහරණය සඳහා මාස 6ක කාල සීමාවකට මුදා හැර තිබුණි. එම නිවස 2012 අගොස්තු මස වන විටත් ආපසු භාරදී නොතිබුණි.

### (ඉ) බේරුම් නොකළ බැරකම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2011 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 01 ට අඩු රු.1,095,325 ක බැරකම් පැවතුණි.

## 2.6 අනුකූල නොවීම්

**(අ) නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති,රීති,රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (i) | **මුදල් රෙගුලාසි** | | |
| | මු.රෙ. 369(ඇ) | 38,125 | සී පන්තියේ දෙපාර්තමේන්තුවක් විසින් එකතු කරනු ලබන මුදල් දිස්ත්‍රික් ලේකම් වෙත ගෙවිය යුතු වුවත්, කුණ්ඩසාලේ සහ මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වර්ෂය තුළ රැස් කරන ලද රු. 38,215 ක හා රු. 500 ක මුදල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නොගෙවා විවිධ ගෙවීම් සඳහා භාවිතා කර තිබුණි. |
| | මු.රෙ. 371(2) | 52,500 | දෙන ලද අතුරු අග්‍රිම අදාළ කාර්ය නිම කළ වහාම පියවිය යුතු වුවද, තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියෙකු විසින් දිවි නැගුම වැඩසටහන සඳහා 2011 පෙබරවාරි 10 දින අවස්ථා දෙකකදී ලබාගෙන ඇති රු.52,500ක අත්තිකාරම් විගණන දිනය වූ 2011 දෙසැම්බර් 07 දින වන විටත් පියවා නොතිබුණි |
| | මු.රෙ. 880 හා 1999 අප්‍රේල් 09 දිනැති අංක 1/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ඇප ආඥා පනතේ 2 බී හා සී වගන්ති. | | මුදල්, මුද්දර, දේපළ හා ගබඩා භාරව කටයුතු කරන සියළුම නලධාරින් ඇප තැබිය යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 කට අයත් නිලධාරින් හා සේවකයින් 206 ක් විසින් එසේ ඇප තබා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | මු.රෙ. 751 | 4,118,648 | ලැබෙන සියළුම භාණ්ඩ බඩු ලේඛන පොත්වල ඇතුළත් කළයුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් රු.4,118,648වැය කර මිලදී ගෙන බෙදා හැර තිබුණු ගබඩා භාණ්ඩ තොග පොත්වල සටහන් කර නොතිබුණි. |
| | මු.රෙ. 751(2) | | ආණ්ඩුවේ ගොඩනැගිලිවල ඇති සියළුම විදුලි සවි කිරීම් හා උපකරණ සම්බන්ධයෙන් බඩු ලේඛනයක් වෙනමම පවත්වා ගත යුතු වුවද, පාතදුම්බර, තුම්පනේ, උඩුනුවර හා යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල එම නියමය පරිදි කටයුතු කර නොතිබුණි. |
| | මු.රෙ. 1646 | | ගමන් පිළිබඳ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණනය වෙත ඉදිරිපත් කළයුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04කට අයත් වාහනවලට අදාළ දෛනික ධාවන සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>----------------------- | | |
| | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/91 දරන චක්‍රලේඛය | | මාස 06 ට වරක් ඉන්ධන දහනය පිළිබඳව පරීක්ෂා කර දැවෙන ඉන්ධන ප්‍රමාණයට අනුව ඉන්ධන තුලනය කර ධාවන සටහන් නඩත්තු කළයුත වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 කට අයත් වාහන 14 ක් සම්බන්ධයෙන් එම පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |
| | 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 හා 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92(1) සහ 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන චක්‍රලේඛ | | රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නමද පින්තාරු කළයුතු වුවත්, පස්බාගේ කෝරළේ හා හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වාහන 04 ක් සම්බන්ධයෙන් එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| 2008 පෙබරවාරි 06 දිනැති අංක 06/2008 දරන චක්‍රලේඛය | 515,194 | කුණ්ඩසාලේ, හා දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් විශ්‍රාමිකයින් 10 දෙනෙකු සඳහා ජීවන වියදම් දීමනා වැඩිපුර ගෙවා තිබුණි. |
| 2009 ජූනි 12 දිනැති අංක එච්ඒ/ඩීඒ/12/27 දරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය | | සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා වෙන් කර ඇති රජයේ නවාසවල අනිවාර්යෙන්ම පදිංචි විය යුතු බව අවධාරණය කර තිබියදී, පන්විල, යටිනුවර හා පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙනුවෙන් අළුතින් ඉදිකර තිබුණු නිවාසවල ප්‍රාදේශීය ලේකම්වරුන් පදිංචිව සිටින බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. |

**(iii)** **වෙනත්**

-------

| | | |
|---|---|---|
| 2011 අගෝස්තු 02 දිනැති අංක 1/2011 දරන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | 3,435,000 | උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් චක්‍රලේඛයෙහි 02 ඡේදයේ සඳහන් සුළු වාරිමාර්ග, මාතෘ සායන, පාසල් වැසිකිළි, පෙර පාසල් යන සංවර්ධන කාර්යයන්ට පමණක් වැය කළ හැකි ප්‍රතිපාදන ඊට පරබාහිර වූ අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණයේ ගොඩනැගිලි ඉදිකිරීම්, බැම්, පාලම් හා පිවිසුම් මාර්ග ඉදිකිරීමට සහ උපකරණ ලබා දීම වැනි කාර්යයන් සඳහා වැය කර තිබුණි. 2008 සිට 2011 වර්ෂවල විමධ්‍යගත ප්‍රතිපාදන ග්‍රාමීය ජනතාවගේ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් ක්‍රියාත්මක කළයුතු ව්‍යාපෘති වෙනුවට රු.15,692,320 ක් වටිනා ව්‍යාපෘති 24 ක් අම්බුළුවාව ජෛව විවිධත්ව ඒකකයේ ගොඩනැගිලි හා ප්‍රවේශ මාර්ග, පාලම් ඉදිකිරීමට හා උපකරණ ලබා දීම සඳහා යොදා ගෙන තිබුණි. උඩපළාත සිංහපිටිය වසමේ පුස්තකාලය අසල පාලම ඉදිකිරීම සඳහා 2010, 2011 වර්ෂවල විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ වෙන්කර තිබුණු රු.2,000,000 ප්‍රතිපාදන උපයෝගි කර ගෙන අම්බුළුවාව ජෛව විවිධත්ව ඒකකයේ පුස්තකාලයට යාම සඳහා පාලමක් ඉදිකර තිබුණත් එම ස්ථානයට එවැනි පාලමක |

| | | |
|---|---|---|
| | | අවශ්‍යතාවයක්ද නිරීක්ෂණය නොවූ අතර පුස්තකාල ගොඩනැගිල්ලට පිවිසීමට ගල්පඩිපෙළක්ද පැවතුණි. |
| 2009 නොවැම්බර් 26 දිනැති අංක 1629/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ i කොටස් 2 වැනි සංශෝධිත නියෝගය | 9,200 | සතුන් ප්‍රවාහනය කිරීම සඳහා දෙනු ලබන ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමේ දී, ප්‍රවාහනය කරනු ලබන එක් සතෙකුට රු.50 බැගින් වූ ගාස්තුවක් අයකර 1958 අංක 29 දරන සත්ව පනත යටතේ රාජ්‍ය ආදායමට බැර කළයුතු වුවත්, පන්විල හා පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2010/2011 වර්ෂ වෙනුවෙන් නිකුත් කර තිබුණු ප්‍රවාහන බලපත්‍ර වෙනුවෙන් ගාස්තු අයකර රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි. |
| 2006 ජුලි 31 දිනැති අංක 21 දරන සමෘද්ධි කොමසාරිස් ජනරාල්ගේ පෝෂණ දීමනා චක්‍රලේඛ | 181,000 | දිළිඳු පවුල්වල ගැබිණි හා කිරි දෙන මව්වරුන්ට මාස 20ක් සඳහා රු.500 බැගින් පෝෂණ දීමනා ලබා දිය යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක් විසින් සමෘද්ධි නිලධාරීන් මාර්ගයෙන් නිසි දැනුවත් කිරීම් සිදු නොකිරීම හේතුවෙන් ඉතාම සුළු මව්වරුන් පිරිසක් පමණක් තෝරා ගෙන තිබීමත් ඔවුනට මාස 20 ම ආවරණය වන පරිදි අදාළ දීමනා ලබා නොදීම හේතුවෙන් රු.831,500ක මුද්දර අවලංගු කර තිබුණි. |
| අංක 2011/01 දරන ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | 1,270,651 | පෙර පාසැල් දරුවන් සඳහා නැවුම් කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහන, මුල් ළමාවිය සංවර්ධන සහකාර නිලධාරි මාර්ගයෙන් දියත් කළයුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක 2011 වර්ෂයේ ක්‍රියාත්මක කළ ග්‍රාම සේවා වසම් 48ක් විසින් මෙම වැඩසටහන පිළිබඳ නිසි දැනුවත් කිරීම් සිදු නොකිරීම හේතුවෙන් ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවතිම හේතුවෙන් වෙන් කළ ප්‍රතිපාදනයෙන් 46% ක් පමණ ඉතිරිවී තිබුණි. |

| | | |
|---|---|---|
| 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමණාකරන සේවා චක්‍රලේඛය හා 2011 ජනවාරි 24 දිනැති අංක එච්ඒ/ඒඩීඩී/එස්ජ්සි/17/ පොදු දරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය | 200,116 | අනියම් හෝ ආදේශක පදනම මත සේවකයන් බඳවා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, එම විධානයන්ට පටහැනිව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් විසින් 2010 අගෝස්තු 13 දින සිට ආදේශ කම්කරුවෙකු බඳවාගෙන 2011 දෙසැම්බර් 11 විගණන දින වන විටත් වැටුප් ගෙවමින් පැවතුණි. |

## 2.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය නොවූ ව්‍යාපෘති ප්‍රමාදයන් හා ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත දැක්වේ.

### (අ). ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ දි ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|---|
| | | රු. | | |
| මැදදුම්බර | දුන්හින්න ගොවිපළ මාර්ගයේ පහළ කොටස ජලනළ එළීම | 50,000 | - | මුදල් ප්‍රමාණවත් නොවීම නිසා ක්‍රියාත්මක නොවීම |
| යටිනුවර | ගන්නෝරුව කැන්දකඩුව කඩවරදෙණය මාර්ගයේ අතුරු මාර්ගය සංවර්ධනය කිරීම | 50,000 | 2011 දෙසැම්බර් 12 | සංශෝධිත ව්‍යාපෘති යෝජනාව ක්‍රියාත්මක කිරීමට කාලය ප්‍රමාණවත් නොවීය. |

| | | | | |
|---|---|---|---|---|
| | කහවතුගොඩ පිටකොටුව මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 50,000 | 2011 නොවැම්බර් 20 | ව්‍යාපෘති යෝජනාව වර්ෂය අවසානයේ ලැබුණු බැවින් කාලය ප්‍රමාණවත් නොවීම. |
| | සූර්යගොඩ ඇතුළත මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 40,000 | 2011 නොවැම්බර් 15 | ව්‍යාපෘති යෝජනාව සංශෝධනය කිරීම නිසා කාලය ප්‍රමාණවත් නොවීය. |
| | ගොරකදෙණිය ප්‍රජා ශාලාව ඉදිකිරීම | 25,000 | 2011 දෙසැම්බර් 28 | යෝජනාව ක්‍රියාත්මක කිරීමට කාලය ප්‍රමාණවත් නොවීය. |
| තුම්පනේ | උඩුව ඇලෝට්ටුවත්ත කෘෂි මාර්ගය | 200,000 | 2011 දෙසැම්බර් 15 | කොන්ත්‍රාත් සමිතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොවීම. |
| | කදන්නේන සිට අජන්තා බේකරිය දක්වා දිවෙන කෘෂි මාර්ගය | 300,000 | 2011 දෙසැම්බර් 15 | කොන්ත්‍රාත් සමිතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොවීම. |
| | සියඹලාවත්ත කෘෂි මාර්ගය | 300,000 | 2011 දෙසැම්බර් 15 | -එම- |
| | එලමල්පොත දුල්ලැව උඩදෙණිය කෘෂි මාර්ගය | 100,000 | 2011 දෙසැම්බර් 15 | -එම- |
| | තැන්නේවෙල අරඹේවෙල ඇල අමුණේ සිට අලි අමුණ දක්වා කෘෂි මාර්ගය. | 300,000 | 2011 දෙසැම්බර් 06 | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | උඩුව උඩදෙණිය ඇලවේල්ල පැති බැම්ම ඉදිකිරීම | 30,000.00 | | ගල්වැලි නොමැතිකම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සමිතිය අකමැත්ත ප්‍රකාශ කිරීම. |
| දිස්ත්‍රික් ලේකම් | පුජාපිටිය ප්‍රාදේශීය ලේකම් නිල නිවස | 2,000,000 | - | භූමිය නිරවුල් නොවීම නිසා ප්‍රතිපාදන වෙනත් ව්‍යාපෘතියකට යෙදවීම |

(ආ) **නිම නොකර අත්හැර දමා ඇති ව්‍යාපෘති**

-----------------------------------------

පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත්, නිම නොකර අතහැර දමා තිබුණි.

| **ප්‍රා.ලේ. කාර්යාලය** | **ව්‍යාපෘතිය** | **ඇස්තමේන්තුගත පිරිවැය** | **ආරම්භ කළ දිනය** | **2011 දෙසැම්බර් 31 දිනට වියදම** | **අත්හැර දැමීමට හේතු** |
|---|---|---|---|---|---|
| | | රු. | | රු. | |
| තුම්පනේ | කිනිගම නැගෙනහිර තුන්පැල ඇලවේල්ල සංවර්ධනය කිරීම | 350,000 | 2011.10.28 | 78,639 | අවිච්ජේද |
| | බෝලගල ජනපදයේ වතු නිවාසවලට ප්‍රවිශ්ඨ වන පාර | 100,000 | 2011.10.21 | 32,859 | -එම- |

(ඇ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

--------------------------------

පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේදී ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | වැඩ ආරම්භ කළ දිනය | වැඩ නිමකල යුතු දිනය | 2011 දෙසැම්බර් 31 දිනට වියදම | හේතුව |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| පාතදුම්බර ප්‍රා.ලේ. කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදි කිරීම | 7,343,000 | 2011.07.22 | 2011.12.10 | 2,508,575 | වෙළඳපලේ අමුද්‍රව්‍ය හිඟවීම |

**(ඈ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපාති**

-----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු හට හානියට පත් සිය නිවස නැවත ගොඩ නැඟීම සඳහා රු.50,000ක විස්තීර්ණ ආපදා මුදලක් ගෙවීම් කර තිබුණි. සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී නිවස යළි ගොඩනගා නොතිබුණු බවත්, දුන් ආධාර මුදල ආපසු අයකර ගෙන නොතිබුණි.

(ii) ජාතික සවිය ගම නැගුම 2011 සංවර්ධන යෝජනා යටතේ රු.100,000 ක ප්‍රතිපාදන මත හතරලියද්ද වැලිබණ්ඩියගොඩ දඹගොල්ල මාර්ගය කොන්ක්‍රීට් කර තිබණි. මාර්ගය මාධ්‍යයේ ස්ථාන 03ක් පළුදු කර පරීක්ෂා කිරීමේ දි ඇස්තමේන්තුව පරිදි 4" ඝනකමට තිබිය යුතු කොන්ක්‍රීට් තට්ටුවේ ඝණකම 1" පමණ බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් කොන්ක්‍රීට් කියුබ් 3ක් සඳහා රු.87,750ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. එසේම යථෝක්ත මාර්ගය ප්‍රමිතියෙන් තොරව ඉදිකිරීම නිසා ඒ වෙනුවෙන් වැය කළ රු.100,000 ක මුදල නිශ්ඵල වියදමක් වී තිබූ අතර, මේ සඳහා නිලධාරීන්ගේ දුර්වල අධීක්ෂණය ද හේතු වී තිබුණි.

2.8 **බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළයුතු ශේෂ**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2011 දෙසැම්බර් මාසය සඳහා පිළියෙළ කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයකට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | ගැලැපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය<br>මාස 6 ට වැඩි වර්ෂ 1 ට අඩු | එකතුව |
|---|---|---|---|
| | | රු. | රු. |
| (i) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් | 35,128 | 35,128 |
| (ii) | හඳුනා නොගත් බැර | 89,273 | 89,273 |
| | | | 124,401 |

2.9 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා වැසිකිළියක් ඉදිකිරීම පිණිස රු.671,103ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් මත 2010 අගෝස්තු 06 දින සෘජු ශ්‍රම පදනම මත අදාළ ඉදිකිරීම ඉටු කර තිබුණි. ඇස්තමේන්තුව පිළියෙල කිරීම, අධීක්ෂණය කිරීම, ද්‍රව්‍ය හා ශ්‍රමය සපයා ගැනීම හා ගෙවීම් බිල්පත් සහතික කිරීම කාර්මික නිලධාරියා විසින්ම සිදුකර තිබුණි. ඉටුකර තිබුණු වැඩ විෂයයන්වල සහ සපයා සවිකර තිබුණු භාණ්ඩවල ප්‍රමිතිය ඉතා දුර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

(ආ) උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2004 වර්ෂයේ දී විමධ්‍යගත අරමුදල් යොදවා රු.196,400 ක් වටිනා ප්ලාස්ටික් පුටු 400ක් මිලදී ගෙන තිබුණද, එම පුටු මිලදී ගෙන විගණන දිනය වූ 2011 නොවැම්බර් 05 දින වන විට වසර 7ක් පමණ ගතවී තිබුණද අදාළ ප්‍රතිලාභීන්ට බෙදා නොතිබුණි.

(ඇ) 2011 ගම නැගුම වැඩසටහනේ විශේෂ ව්‍යාපෘතියක් වු වර්ෂාවෙන් හානියට පත් වු සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය යටතේ ඉදිකර තබුණු උඩදුම්බර මදිමිහිය ඇල හා ඇල්ලෙන්පල්ල යන වාරි අමුණු භෞතිකව පරීක්ෂා කිරීමේ දී වර්ෂාවෙන් හානියට පත් වු බවක් දක්නට නොලැබුණු අතර, මීට පෙර ඉදිකිරීම නතර කර තිබුණු ස්ථානවල සිට ඉදිරියට තිබුණු වැඩ කොටස් නිම කර තිබුණි.

## 2.10 අවිධිමත් ගනුදෙනු

------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු ඇතැම් ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරවීම්

---------------------------------------------

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6:2:2 වගන්තිය අනුව තරඟකාරී ලංසු ඉදිරිපත් කිරීම සඳහා අවම වශයෙන් දින 07ක කාලයක් ලබාදිය යුතු වුවද, 2011 වර්ෂයේ ප්‍රාදේශීය ලෙකම් කාර්යාල 04ක් විසින් රු. 1,226,720 ක බැනර් හා ආහාර ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා මිල කැඳවීමට ඊට වඩා අඩු කාලයක් ලබා දී තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත් පොතෙහි 2.14.1 ඡේදයට අනුව වෙළඳපළ මිල සැදහුම් ක්‍රමය සඳහා අවම වශයෙන් ආයතන පහකින් මිල ගණන් කැඳවීම් කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කිරීමකින් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09ක් විසින් රු. 2,134,607 ක ගබඩා ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි.

### (ආ) වෙනත්

--------

උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු අංක: 77 පල්ලේවෙල ගම්පොල පිහිටි රජයේ ගොඩනැගිල්ලක් කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන වෙත විධිමත් ගිවිසුමකට එළඹීමෙන් තොරව 2010 වර්ෂයේ සිට රු.25,000 ක මාසික කුලි පදනම මත ලබා දී තිබුණි. 2011 නොවැම්බර් තෙක් එමඟින් ලද රු.500,000 ක ආදායම රජයේ ආදායමට බැර කිරීමෙන් තොරව පෞද්ගලික ආයතනයක් වෙත ලබා දී තිබුණි.

## 2.11 වංචනික ස්වරූපයේ ගනුදෙනු

--------------------------------

නියැදි විගණන පරීක්ෂණ වලදි නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ

(අ) උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අම්බුළුවාව ඉහළ කොටස පාර සකස් කිරීමේ කර්මාන්තය සඳහා 2010 වර්ෂයේ රු.576,000ක විමධ්‍යගත ප්‍රතිපාදන ලබාදී තිබුණි. මේ සම්බන්ධව කරන ලද භෞතික පරීක්ෂාවට අනුව අදාල ඉදිකිරීම සිදු නොකර හා විධිමත් අනුමැතියකින් තොරව එකී ප්‍රතිපාදන උපයෝගි කර ගෙන අම්බුළුවාව ජෛව විවිධත්ව ඒකකයේ නැරඹුම් මැදිරිය ඉදිකර තිබුණි.

(ආ) උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් යතුරු පැදියක් රාජකාරි කටයුතු සඳහා සමාජ සංවර්ධන නිලධාරියා වෙත 2007 මැයි 30 දින භාරදී තිබුණි. 2011 නොවැම්බර් 17 දින දක්වා එම නිලධාරියා විසින් යතුරුපැදිය පාවිච්චි කර තිබුණද, 2005 වර්ෂයෙන් පසු ආදායම් බලපත්‍රය හා රක්ෂණ සහතිකය ලබා ගෙන නොතිබුණු අතර, රාජකාරියේ යෙදුණු බවට සනාථ කර ගැනීම සඳහා වූ දෛනික ධාවන සටහන්ද විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) ජාතික සවිය ගම නැගුම 2011 වැඩසටහන යටතේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් මගින් රු.100,000 බැගින් වූ ප්‍රතිපාදන මත ඉටුකර තිබුණු වරකාව තැපැල් කාර්යාල මාර්ගය කොන්ක්‍රීට් කිරීම සහ මිවත්ත පොල්වත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයන්හි ඉටුනොකළ වැඩ විෂයයන් සඳහා රු.14,089 බැගින් රු. 28,178 ක් ගෙවීම් කර තිබුණි.

## 2.12 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය ව පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක් වේ.

(අ) හතරලියද්ද ප්‍රාදේශීය ලේකම්වරයා භාවිතා කරනු ලබන රථය 2010 දෙසැම්බර් 10 දින අනතුරකට පත්වීමෙන් පසු රු.146,524 ක මුදලක් වැය කර රථය අළුත්වැඩියා කර තිබුණි. එම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පරීක්ෂණයක් කර පූර්ණ වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

(ආ) දොළුව ප්‍රාදේශීය ලේකම්වරයා භාවිතා කරනු ලබන මෝටර් රථයක් 2010 ඔක්තෝබර් 03 දින රාජකාරිමය නොවන ගමනක යෙදී සිටියදී අනතුරකට භාජනය වී රු.715,853 ක් වැය කර එම වාහනය අළුත්වැඩියා කර තිබුණි. මුදල් රෙගුලාසි 104(4) පරිදි පරීක්ෂණයක් කර පූර්ණ වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 104(4) අනුව අනතුර සිදුවී මාස 03 ක් ඇතුළත පරීක්ෂණයක් කර පූර්ණ වාර්තාවක් ලබාගත යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අයත් වාහන 03ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 2.13 අනාර්ථික ගනුදෙනු

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) උඩපලාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් දෙල්ගොල්ල බිබිල මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා ජාතික සවිය ගම නැගුම 2010 හා 2011 වැඩසටහන් මගින් ලද ප්‍රතිපාදන මත රු. 482,927 ක් වැය කර තිබුණි. මෙම මාර්ගය ප්‍රයෝජනයට ගන්නා ප්‍රතිලාභීන් සංඛ්‍යාව 04 දෙනෙකු පමණක් සීමා වී තිබුණි.

(ආ) අංක 09/2009 හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි ආයතනයක සිටින සේවක සංඛ්‍යාව ගැන නොසලකා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයට ගත යුතු වුවද, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2009 වර්ෂයේ දි රු.64,500 ක මුදලක් වැය කර ඇඟිලි සලකුණු කිරීමේ යන්ත්‍රයක් සවිකර තිබුණද, එම යන්ත්‍රය සවිකරන ලද දිනයේ සිට නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම පිළිබඳව මුද්‍රිත පිටපත් ලබා ගැනීමට නොහැකිව තිබුණි. මේ හේතුව නිසා යථෝක්ත චක්‍රලේඛයෙහි විධිවිධාන අනුගමනය කිරීමට වගකිව යුතු නිලධාරීන් පැහැර හැර ඇති අතර, ඒ සඳහා දරන ලද වියදම ද නිෂ්ඵල වී තිබුණි.

## 2.14 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2011 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | 01 | - |
| (ii) | තෘතික මට්ටම | 66 | 62 | 04 |
| (iii) | ද්විතික මට්ටම | 1874 | 1602 | 262 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 227 | 202 | 25 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 14 | - |
| | එකතුව | 2168 | 1881 | 291 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 291 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) අංක 18/2011 හා 2001 අගෝස්තු 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව දීප ව්‍යාප්ත සේවාවල නියුතු නිලධාරීන් වසර 05 ක් එකම කාර්යාලයේ සේවය කර ඇත්නම් වහාම ස්ථාන මාරුවීම් ලබාදිය යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට අයත් නිලධාරීන් 104 දෙනෙකු විසින් එම කාලසීමාව ඉක්මවා සේවය කරමින් පැවතුණි.

(iii) දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙ පරිපාලන නිලධාරි තනතුර 2009 වර්ෂයේ සිට වසර 03කට ආසන්න කාලයක් පුරප්පාඩුව පැවතියද, එම පුරප්පාඩුව සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, 2009 වර්ෂයේ සිට 2011 නොවැම්බර් මාසය දක්වා මෙම තනතුරේ වැඩ බැලීම සඳහා රු. 104,616 ක් වැඩ බැලීමේ වැටුප් ගෙවා තිබුණි.

(iv) පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සරප් තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා නිලධාරියෙකු පත් කර නොතිබුණු අතර, ආදායම් රැස් කිරීමේ දී විෂය භාර නිලධාරීන් විසින් පොදු මුදල් භාර ගැනීමේ කුවිතාන්සි නිකුත් කර ආදායම් රැස් කිරීමේ ක්‍රමයක් ද අනුගමනය කර තිබුණි.

## 2.15 අභ්‍යන්තර පාලනය

--------------------

**විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------------

2009 ජුනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/2009(i) හි 05 හා 06 ඡේදයන්ට අනුකූලව පිහිටවනු ලැබූ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ සංයුතියට විගණකාධිපතිගේ නියෝජිතයෙකු ඇතුළත්ව නොතිබුණි. පළමු රැස්වීම 2012 අගෝස්තු 13 දින පවත්වා තිබුණද, 2012 සැප්තැම්බර් 12 විගණන අවස්ථාව දක්වාද එහි ප්‍රගතිය වාර්තා කර නොතිබණි.